බන්ධ: කො: ජනරාල් චක්‍රලේඛ අංක:- 15 /2010

මගේ අංකය-කේ.01/02
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2010.03.09 වෙනි දින.

බන්ධනාගාර අධිකාරින් හා
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

## ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් විශේෂ රාජ්‍ය සමාව -2010-03-08

2010-03-08 වෙනි දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමන් විසින් බන්ධනාගාර ගතව සිටින සිරකාරියන් හට පහත දැක්වෙන පරිදි විශේෂ රාජ්‍ය සමාවක් ප්‍රදානය කර ඇත

01. 2010-03-08 දින වනවිට දඩමුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතකරන ලද සිරකාරියන්ගේ ගෙවෙමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.

02. 2010-03-08 දිනට පාදඩ ආඥාපනත යටතේ සිරදඬුවම් ලැබ දඬුවම් විඳිමින් සිටින සිරකාරියන්ගේ දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

03. 2010-03-08 දිනට වයස අවුරුදු 70 ට වැඩි සිරකාරියන්ගේ ගෙවෙමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් විඳින සිරකාරියන්ට ඉහත සඳහන් අංක: 01 යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ

| වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|
| I. නීති විරෝධී රැස්වීම | 140 සිට 142 සහ 146 |
| II. මංකොල්ල | 380, 382 සහ 383 |
| III. ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431,432,440,441 ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| IV. රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114- 123 |
| V. පැහැරගෙන යාම | 354-360 |
| VI. අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාල ප්‍රදර්ශනය | 286 A |
| VII. ළමුන්ට හිංසා කිරීම | 308 A |
| VIII. කුට්ටනය | 360 A |
| IX. ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජන ගැනීම | 360 B |
| X. තැනැත්තන් වෙළෙඳාම් කිරීම | 360 C |
| XI. දූෂණය කිරීම | 364 |
| XII. ව්‍යාභිචාරය | 364 A |
| XIII. අස්වාභාවික වැරදි | 365 |
| XIV. පුද්ගලයන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 365 A |
| XV. බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |

XVI. අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වූවන්
XVII. 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි
XVIII. ගිනි අවි ආඥා පනතේ යටතේ වැරදි
XIX. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්දන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි
XX. 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි
XXI. වස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත
XXII. හදිසි නීතිය යටතේ වැරදිකරුවන් වූවන්
XXIII. ආදායම් බදු නඩුවල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඬුවම් විඳින්නවුන්
XXIV. රේගු ආඥා පනත යටතේ වැරදිකරුවූවන්
XXV. 1948 අංක 20 ආගමන හා විගමන ආඥා පනත යටතේ වැරදිකරුවූවන්
XXVI. ඉහත අංක 01 සිට xxv යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධ හමුදා පනත, නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය.

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2010-03-08 වන දින වනවිට සැබැවින්ම බන්ධනාගාර ගතව සිටින සිරකාරියන් කෙරෙහි පමණි.

එක් සිරකාරියකට ඉහත සඳහන් විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහැරීමට නියමිත සිරකාරියන් වහාම නිදහස් කිරීමට කටයුතු කර, එසේ නිදහස්කරනු ලබන සිරකාරියන් සංඛ්‍යාව දුරකතන පනිවුඩයක් මගින් හෝ ෆැක්ස් පනිවුඩයක් මගින් දැනුම්දී නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව යනාථ කරන්න. මෙම විශේෂ සමාව සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්වයක් ඇතිවුවහොත් නිදහස් කිරීමට පෙර මාගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න.

(signature)

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.